රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :-20/2001

මගේ අංකයː ආ1/35
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2001.09.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

## ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 15 වගන්තිය සංශෝධනය කිරීම

1998.01.30 දිනැති අංක 3/98 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 15 වගන්තිය පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කෙරේ.

(අ) දැනට පවත්නා 15 : 1 (I) හා (II) උප වගන්ති ඉවත් කොට පහත සඳහන් උප වගන්ති ආදේශ කිරීමෙන්,

15 : 1 : (I) රාජකාරි ස්වභාවය සහ වගකීම් සැලකිල්ලට ගෙන අවශ්‍ය තනතුරු සම්බන්ධයෙන් පමණක් කාර්යක්ෂමතා කඩඉමක්/කඩඉම් බඳවා ගැනීම් පරිපාටියට/සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කළයුතුය.

15 : 1 (II) වැටුප් පරිමාණය නියම කිරීමේදී එහි 04 වන වැටුප් පියවරට එළඹීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු බවද, දෙවන කාර්යක්ෂමතා කඩඉමක් නියම කරන්නේ නම්, එය 07 වන වැටුප් පියවර එළඹීමට පෙර සමත්විය යුතු බවද සඳහන් කළයුතුය.

(ආ) 15 : 1 (X) වශයෙන් අලුතින් උප වගන්තියක් එකතු කිරීමෙන්,

15 : 1 (X) වයස අවුරුදු 45 සම්පූර්ණවීම මත කාර්යක්ෂමතා කඩඉම් විභාගවලින් නිදහස් නොකරන අතර, බඳවා ගැනීමේ පරිපාටිවල හෝ සේවා ව්‍යවස්ථාවල හෝ වයස සම්පූර්ණවීම මත කාර්යක්ෂමතා කඩඉම් විභාගවලින් නිදහස් කිරීමට විධිවිධාන ඇතුළත් නොකළ යුතුය.

02. වයස අවුරුදු 45 සම්පූර්ණවීම මත කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරන බවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ හෝ සේවා ව්‍යවස්ථාවේ දැනට විධිවිධාන පවත්නා තනතුරුවල සේවය කරන නිලධාරීන්ට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයට පෙර අවුරුදු 45 සම්පූර්ණ වන්නේ නම්, එවැනි නිලධාරීන් එම විධිවිධාන මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කළයුතුය.

03.  දැනට බලපවත්නා බඳවා ගැනීම් පරිපාටිවල හෝ සේවා ව්‍යවස්ථාවල අවුරුදු 45 සම්පූර්ණවීම මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස්වීමට විධිවිධාන තිබුනේ වුවද, මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට එම විධිවිධාන අහෝසි වන අතර, එවැනි නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්විය යුතුය. අවුරුදු 45 සම්පූර්ණවීම මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් වීමට හිමිකම තිබුණු එහෙත් මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීම නිසා එම හිමිකම නොලැබෙන නිලධාරීන්ට එම කඩඉම සමත්වීම සඳහා මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයේ සිට වසර 3 ක සහන කාලයක් ලබාදිය යුතුය. එම කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම සමත් වුවහොත් එසේ සමත් වූ දිනය හෝ වයස අවුරුදු 45 සම්පූර්ණ වන දිනය හෝ යන දින දෙකින් කලින් එළඹෙන දින එම විභාගය සමත් වූවා සේ සළකා ක්‍රියා කළයුතුය.  මෙම නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවිය යුත්තේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීමෙන් පසුව පමණකි.

04.  දැනටමත් වැටුප් වර්ධක විලම්භනය කර ඇති ඉදිරි අවුරුදු 3 තුළ වයස අවුරුදු 45 සම්පූර්ණ වන නිලධාරීන් මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට වසර 3ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වුවහොත් එසේ සමත්වන දිනය හෝ වයස අවුරුදු 45 සම්පූර්ණ වන දිනය යන දින දෙකින් කලින් එළඹෙන දින කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළාසේ සැලකේ. වසර 3ක් ඇතුළත විභාගය සමත් නොවුවහොත් දැනටමත් සිදුකර ඇති වැටුප් වර්ධක විලම්භනය කිරීම විභාගය සමත්වන තෙක් ක්‍රියාත්මක වේ.

05.  මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2001 ඔක්තෝබර් මස 01 දින සිට ක්‍රියාත්මක වේ.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය